# 2023/11/30 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී පැවති කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

2023/11/30 වන දින පෙ.ව.09.00ට සභා ලේකම්තුමිය විසින් පැමිණ සිටි කලාප භාර විමර්ශන නිලධාරී ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා, කාර්මික නිලධාරී ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා, ප්‍රධාන කළමනාකරණ සහකාර(වැ.බ.) ජී.කේ.ද සොයිසා මහත්මිය, සංවර්ධන නිලධාරී ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය, කළමනාකරණ සේවා නිලධාරී කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා හා විෂය නිලධාරී පිළිගනිමින් කළමනාකරණ කමිටුව ආරම්භ කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව සභා ලේකම්තුමිය විසින් 2023/11/16 දිනැති පසුගිය කමිටු රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී. පසුගිය කමිටු රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව කමිටු සාමාජිකයින් ඒකමතිකව අනුමත කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව දිනට නියමිත කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

I. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛණය සඳහා අවශ්‍ය නිර්දේශය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල වවුචර්පත්

a. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛන

| අනු අංකය | නම හා විස්තරය | ගෙවූ මුදල | කමිටු තීරණය |
|---|---|---|---|
| 01. | පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ, පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය, කහගොල්ල, බණ්ඩාරවෙල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු යන්ත්‍ර හා රථ වාහන පරීක්ෂා සහ මිළ සාධාරණීය වාර්තා ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම්.(බිල්පත් අංක - JR/IN/K/23/10/2871, 9978, 9975, 9974, 9973, 1558894471) | 13,488.16 | නිර්දේශ කරන ලදී. |
| 02. | ඒ.එම්.විජිත ප්‍රියන්ත මයා, රියදුරු - කාර්යාල රාජකාරි කටයුතු සඳහා යාම වෙනුවෙන් 2023/10/03,04,09,10,17,21,22,23 දිනයන් සඳහා ගමන් වියදම් ගෙවීම. | 5,600.00 | නිර්දේශ කරන ලදී. |
| 03. | ආර්.එම්.මදුසිකා රත්නායක මයා, සංවර්ධන නිලධාරී - දත්ත විශ්ලේෂනය හා දෘෂ්‍යකරණ ඒකකය පුහුණුව සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යාම වෙනුවෙන් 2023/11/17 දින ගමන් වියදම් ගෙවීම. | 700.00 | නිර්දේශ කරන ලදී. |
| 04. | ඩී.එම්.ලහිරු සඳරුවන් මයා, කළමනාකරණ සේවා නිලධාරී - වාහන රාජකාරි හා චිත්‍ර ප්‍රදර්ශනයේ රාජකාරි සඳහා වාහන නඩත්තු ඒකකයට සහ මුද්‍රණාලයට යාම වෙනුවෙන් 2023/09/13,21,22,25 දින ගමන් වියදම් ගෙවීම. | 3,100.00 | නිර්දේශ කරන ලදී. |
| 05. | ඩී.එම්.ලහිරු සඳරුවන් මයා, කළමනාකරණ සේවා නිලධාරී - වාහන රාජකාරි සඳහා වාහන නඩත්තු ඒකකයට,පළාත් පාලන දෙපාර්තමේන්තුවට සහ කන්දකැටිය පොලිස් ස්ථානයට යාම වෙනුවෙන් 2023/11/03,13 දින ගමන් වියදම් ගෙවීම. | 1,400.00 | නිර්දේශ කරන ලදී. |
| 06. | ඩී.එම්.ලහිරු සඳරුවන් මයා, කළමනාකරණ සේවා නිලධාරී - දත්ත විශ්ලේෂණය හා දෘෂ්‍යකරණ ඒකකය පුහුණුව සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යාම වෙනුවෙන් 2023/11/17 දින ගමන් වියදම් ගෙවීම. | 700.00 | නිර්දේශ කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| 07. | ඩී,එම්.කිර්ති උපනන්ද මයා, ක්ෂේත්‍ර කම්කරු - ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන සඳහා ඇල්ල ප්‍රාදේශීය සභාවට යාම වෙනුවෙන් 2023/11/07,08 දින ගමන් වියදම් ගෙවීම. | 1,400.00 | නිර්දේශ කරන ලදී. |
| 08. | කළමනාකරු, ධම්මික මෝඩර්න් හෝම්ස්(පුද්ගලික) සමාගම, බදුල්ල - Power consumption (50w-60w) වෝල් ෆෑන් 02 මිලදී ගැනීම.(ප්‍ර:තී:අංකය - මී/ප්‍රාස/ආ/02/2023-37, බිල්පත් අංක- 001598) | 43,000.00 | නිර්දේශ කරන ලදී. |
| 09. | කළමනාකරු, රෆික්ස් ඉලෙක්ට්‍රොනික්ස්, බසාර් වීදිය, බදුල්ල - විදුලි පන්දම් 01 සහ ඩිජිටල් තරාදි 01 මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම.(ප්‍ර:තී:අංකය - මී/ප්‍රාස/ආ/02/2023-27, බිල්පත් අංක- 2178) | 3,100.00 | නිර්දේශ කරන ලදී. |
| 10. | ඩී.එම්.ලහිරු සඳරුවන් මයා, කළමනාකරණ සේවා නිලධාරි - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම්තුමියගේ මුද්‍රා සකස් කිරීම සඳහා අතින් දරන ලද මුදල් පියවීම. | 3,700.00 | නිර්දේශ කරන ලදී. |
| 11. | ආර්.එම්.ටී.සඳරුවන් මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, තල්දෙන - මීගහකිවුල ප්‍රාදේශීය සභාව 2023 ඔක්තෝම්බර් මස ඩෙංගු හා සෞඛ්‍ය සම්බන්ධ රාජකාරි කටයුතු ඉටු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 2,000.00 | නිර්දේශ කරන ලදී. |
| 12. | ඩී.එම්.ශානිකා මධුරංගනී මිය, අංක 25, අග්ගලා උල්පත, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් වැකර් යන්ත්‍රය කුලියට ලබා ගැනීමේදී ගෙවන ලද මුදලෙන් වැකර් යන්ත්‍රය යොදවා ගත් කාලයට පමණක් මුදල් අය කර ඉතිරි මුදල නැවත ගෙවීම. | 977.20 | නිර්දේශ කරන ලදී. |
| 13. | එම්.කේ.දයාවංශ මයා, අංක.06, උඩඹතුඹ, වටගොම්මන, පිටමාරුව - පිටමාරුව සතිපොළ පිරිසිදු කිරීම වෙනුවෙන් 2023 අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝම්බර් මස වල දීමනා ගෙවීම | 6,500.00 | නිර්දේශ කරන ලදී. |
| 14. | රෙජිස්ට්‍රාර් ජනරාල් - මුද්දර ආදායම් උපලේඛන සැකසීම වෙනුවෙන් කාර්ය මණ්ඩල දිරිදීමනා ගෙවීම.( 2023 වර්ෂයේ ජනවාරි සිට ජුනි මාසය දක්වා) | 5,300.00 | නිර්දේශ කරන ලදී. |
| 15. | එම්.සුන්දරේෂ්වරන් මයා - 2024 වර්ෂයට ආදායම් පැනවීමට අදාල ගැසට් නිවේදනය ඉංග්‍රීසි හා දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 34,022.50 | නිර්දේශ කරන ලදී. |
| 16. | කළමනාකරු, තවිඳු පොත්හල, මීගහකිවුල - මීගහකිවුල, පිටමාරුව, කළුගහකඳුර පුස්තකාල තුනෙහි ඔක්තෝම්බර් මස පුවත්පත් බිල්පත් පියවීම. | 15,950.00 | නිර්දේශ කරන ලදී. |
| 17. | ඩී.එම්.ලහිරු සඳරුවන් මයා, කළමනාකරණ සේවා නිලධාරි - පුහුණුව වැඩසටහන සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යාම වෙනුවෙන් 2023/10/05 දින ගමන් වියදම් ගෙවීම. | 1,000.00 | නිර්දේශ කරන ලදී. |

b. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා ලද සේවකයින් , ආදේශක පදනමින් බඳවා ගන්නා ලද සේවකයින් හා අනියම් සේවකයින් සඳහා 2023 නොවැම්බර් මස වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

II. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 252-6368 කැබ් රථයේ රියදුරු ලෙස සේවය කරන වයි.එම්.නුවන් හර්ෂණ මහතා විසින් වර්ෂාව ඇති දින වල භාවිතය සඳහා කුඩයක් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

III. 554/05 අංක දරණ 1989.04.17 දැනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ xii අධිකාරය ගබඩා හා ද්‍රව්‍ය යන ඡේදය යටතේ අංක 203ට අනුව මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීමට අවශ්‍ය වී ඇත. ඒ සඳහා භාණ්ඩ සමීකෂණ නිලධාරි මණ්ඩලය පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් නම් කර එවන නිලධාරියෙකු හෝ දෙදෙනෙකු අප ආයතනයේ කාර්මික නිලධාරි බී.එම්.හිරන්ත ලක්ෂාන් මහතා,සංවර්ධන නිලධාරි ටී.එම්.ඩිලේකා මධුමානි මිය, කළමණාකරන සහකාර ආර්.එම්. නිල්මිණි සකුන්තලා මිය 2023 භාණ්ඩ සමීක්ෂණ නිලධාරි මණ්ඩලය සඳහා පත් කර ගැනීමට සහ භාණ්ඩ සමීක්ෂණ නිලධාරීන්ට සංයුක්ත දීමානව හා නිවාඩු දිනයන්හිදි රාජකාරි සඳහා අතිකාල ගෙවීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් නිලධාරීන් පත් කිරීමෙන් පසු කමිටුව පත් කිරීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

IV. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු පහත වාහන සඳහා අළුත්වැඩියාව සිදු කිරීම සඳහා ඉදිරිපත් කරමි.

a) UPLL-6984 ටිපර් රථය, 2023.11.08 වන දින අනතුරට ලක් වූ UPRD-6200 ට්‍රැක්ටර් රථය හා UPRW-5317 දරණ ට්‍රැක්ටර් ටේලරය අළුත්වැඩියාව සඳහා පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂකගේ අංක පිළිවෙලින් 9973, 9975, 9978 හා 2023.11.14 දින වැඩමුලික නිර්දේශ ලබා ගෙන ඇත. ඒ අනුව මෙම වාහන අළුත්වැඩියාව සඳහා ලබා ගත් වැඩමුලික නිර්දේශය අනුව ප්‍රසම්පාදනය කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

b) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දුන් UPKH-8201 ජීප් රථයේ වැඩමුලික වාර්තාව පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂකගේ අංක 9974 හා 2023.11.14 දින වැඩමුලික නිර්දේශය අනුව ප්‍රසම්පාදනය කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

V. මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් කිඩ්ස් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය සඳහා 2024 වර්ෂයට ළමුන් බඳවාගැනීමට අයදුම්පත් කැඳවන ලද අතර, අයදුම්පත් 26ක් නිකුත් කරන ලදී. එම අයදුම්පත් වලින් අයදුම්පත් 25ක් නැවත භාර දී ඇත. සභාව විසින් ඉදිරිපත් කරන ලද කොන්දේසි වලට යටත්ව එම අයදුම්පත් ඉදිරිපත් කර ඇති අතර, බඳවාගැනීම සිදු කරන්නේ ළමුන් 25කු වන බැවින් සම්මුඛ පරික්ෂණයක් නොපවත්වා මුලික සුදුසුකම් සපුරා ඇත්ද යන වග බලා මුලික සුදුසුකම් අභ්‍යන්තර පරික්ෂා කිරීමට ලක් කර සම්මුඛ පරීක්ෂණයකින් තොරව ළමුන් බඳවා ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

- එමෙන්ම කිඩ්ස් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය සඳහා දෙවන අවුරුදු සඳහා ළමයෙකු ඇතුලත් කිරීම සඳහා ඉල්ලීමක් සිදු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් කිඩ්ස් පෙර පාසලේ දෙවන වසර සඳහා පුරප්පාඩු තිබුණහොත් එම පුරප්පාඩුව සම්පූර්ණ කිරීම සඳහා ළමයින් බඳවා ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

VI. මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් කිඩ්ස් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ 2024 වර්ෂයේ පාසල් යන ළමුන් සඳහා සහතික පතක් ලබාදීම සිදු කරන අතර, එම සහතිකපත් 25ක් මුද්‍රණය කරගැනීම සඳහා මිළ ගණන් කැඳවීමට අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

VII. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍ර සූත්‍ර කිහිපයක් සඳහා දීර්ඝ කාලීනව ආදායම් බලපත්‍ර ලබා නොමැති බව නිරීක්ෂණය වන අතර එය පහත පරිදි වේ. මෙම ආදායම් බලපත්‍ර ලබාගෙන නොමැති වාහන හා යන්ත්‍ර සඳහා අදායම් බලපත්‍ර ලබා ගැනීමට වැය වන මුදල හා කාලසීමාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආදායම් බලපත්‍ර නිකුත් කරනු ලබන නිළධාරියාගෙන් විමසීම මගින් ලබා ගන්නා ලදි.

| අනු අංකය | වාහන අංකය | වාහන වර්ගය | අවසන් වරට ආදායම් බලපත් ලබා ගත් දිනය | අවසන් වරට ලබා ගත් ආදායම් බලපත්‍රය කල් ඉකුත් වන දිනය | නව ආදායම් බලපත්‍රය ලබා ගැනීමට වැය වන මුදල ( 2023.11.27 දිනට ) |
|---|---|---|---|---|---|
| 01 | WP ZA 5003 | බැකෝ ලෝඩරය | 2017.05.27 | 2018.05.26 | 40950.00 |
| 02 | UP RW 4097 | බවුසර් ටේලරය | 2011 | 2012 | 24180.00 |
| 03 | UP RW 5317 | ට්‍රැක්ටර් ටේලරය | 2012 | 2013 | 24180.00 |
| 04 | UP RB 9997 | ට්‍රැක්ටර් රථය | 2011 | 2012 | 5550.00 |

ඒ අනුව මෙම වාහන සඳහා ඉදිරි වර්ෂය ආදායම් බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

මීළඟට න්‍යාය පත්‍රානුකූලව වෙනත් කරුණු ඉදිරිපත් කරන ලදී.

1. පෝස්ට් මාස්ටර් ජනරාල්ගේ මහජන බැංකුවේ අංක 010100179027344 ගිණුමට බැර - නිදහස් තැපැල් මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම වෙනුවෙන් ගෙවීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2. සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

3. මීගහකිවුල ප්‍රාදේශීය සභා සියළු කාර්ය මණ්ඩල සමාජිකයින්ගේ 2023 වර්ෂ අවසානයේ ආකල්ප වර්ධන වැඩසටහනක් සැලසුම් කිරීම සඳහා සභා අරමුදලින් උත්සව සඳහා වෙන් කර ඇති මුදලින් රු:50,000.00ක මුදලක් ලබා ගැනීමේදී ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගන්නා ලෙස නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ආදේශක සේවකයින්ගේ 2021,2022 හා 2023 වර්ෂයන්හි සේවා නියුක්ති භාර අරමුදල් වැටුප් අවකරණ සඳහා යොමු කළ චෙක්පත් ප්‍රමාදවීම මත රු:776.76 ක අධිභාර මුදලක් දින 14ක් ඇතුලත ගෙවන ලෙස එම මණ්ඩලය විසින් දැනුම් දී ඇත.එම නිසා සභා අරමුදලෙන් රු:776.76ක අත්තිකාරම් මුදලක් ලබා ගෙන එය පියවූ අතර ඒ.එම් අනුරාධා ශ්‍යාමලී මිය විසින් 2023.05.15 දින සිට රාජකාරි භාර ගත් අතර එම අත්තිකාරම මුදල පියවීම සම්බන්ධව වගකිව යුතු පාර්ශව හා ගත යුතු ක්‍රියා මාර්ග සම්බන්ධ කමිටු විසින් තීරණය කරන ලද්දේ සභා අරමුදලෙන් ගෙවීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු තල්දෙන, පිටමාරුව, කරමැටිය සති පොලවල් හා මීගහකිවුල පොදුපහසුකා මධ්‍යස්ථානය නැවත ටෙන්ඩර් කිරීම සම්බන්ධව තීරණය කිරීම සඳහා ඒ සඳහා වැය වන මුදල සඳහා එම සතිපොලවල් වලින් සහ පොදු පහසුකා මධ්‍යස්ථානයෙන් ලැබෙන ආදායම ඇතුලත් කර ඉදිරි කමිටු රැස්වීම සඳහා ඉදිරිපත් කරන ලෙස කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6. කොට්ඨාශ සංවර්ධන සැළසුම(WLADP) සහ පළාත් පාලන ආයතන සහභාගීත්ව සංවර්ධන සැලැස්ම(LAPDP) සකස් කිරීමටත්, පළාත් පාලන ආයතන සහභාගීත්ව සංවර්ධන සැළසුම් කමිටුව

පිහිටුවා ගැනීම සඳහා පහත සඳහන් නිලධාරීන් පත් කිරීම සහ ඊට අදාළ වැය දැරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

**සැළසුම් කමිටුව:-**

I. ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙය, සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල.
II. ඒ.එල්.ඒ.ඩී.චන්දිම මයා, ප්‍රජා සංවර්ධන නිලධාරි, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, බදුල්ල.
III. කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මයා, විෂය නිලධාරී, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල.
IV. ඩී.එම්.කීර්ති උපනන්ද මයා, විෂය සහාය නිලධාරී, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල.
V. ආර්.එම්.එල්.ජේ.රත්නායක මයා, තාක්ෂණ නිලධාරී, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල.

දිනට නියමිත කරුණු අවසන් බැවින් හා සාකච්ඡා කිරීමට වෙනත් කාරණා නොමැති බැවින්, සභා ලේකම්තුමියගේ ස්තුති කතාවෙන් අනතුරුව කළමනාකරණ කමිටුව පෙ.ව.11.00ට අවසන් කරන ලදී.

**කමිටු සාමාජිකයින්:-**

1) ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙනවිය (සභාපති) -
2) ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා (කමිටු සාමාජික) -
3) ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා (කමිටු සාමාජික) -
4) ජී.කේ.ද සොයිසා මහත්මිය (කමිටු සාමාජික) -
5) ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය (කමිටු සාමාජික) -
6) කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා (කමිටු සාමාජික) -